# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 2009 අංක 59 දරන ශ්‍රී ලංකා ජමාඅත් අන්සාරිස් සුන්නතිල් මොහමදියා සංගමය (සංස්ථාගත කිරීමේ) පනත

---

**[සහතිකය සටහන් කළේ 2009 ඔක්තෝබර් මස 21 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2009 ඔක්තෝබර් මස 23 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකි ය.

**මිළ :** රු. **6.00 යි.** | **තැපැල් ගාස්තුව :** රු. **5.00 යි.**

## 2009 අංක 59 දරන ශ්‍රී ලංකා ජමාඅත් අන්සාරිස් සුන්නතිල් මොහමදියා සංගමය (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 2009 ඔක්තෝබර් මස 21 වන දින]

එල්. ඩී.— ඕ. (අයි.එන්.සී.) 2/2008.

### ශ්‍රී ලංකා ජමාඅත් අන්සාරිස් සුන්නතිල් මොහමදියා සංගමය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.

"ශ්‍රී ලංකා ජමාඅත් අන්සාරිස් සුන්නතිල් මොහමදියා " යනුවෙන් සඳහන් කරනු ලබන සහ හඳුන්වනු ලබන සංගමයක් එහි සාමාජිකයන් එකඟ වූ රීති අනුව සංගමයට සම්බන්ධ සියලු පරමාර්ථ සහ කාරණා ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමේ සහ කරගෙන යාමේ කාර්යය සඳහා මෙතෙක් කල් ශ්‍රී ලංකාවේ පිහිටුවා තිබුණු හෙයින් ද: පූර්විකාව.

ඒ සංගමය පිහිටුවනු ලද්දේ යම් පරමාර්ථ සහ කාරණා සඳහා ද, ඒ පරමාර්ථ හා කාරණා ඒ සංගමය විසින් මෙතෙක් කල් සාර්ථක ලෙස ක්‍රියාත්මක කර හා ඉටු කර ඇති හෙයින් ද, ඒ සංගමය සංස්ථාගත කිරීමට ඉල්ලුම් කර ඇති හෙයින් ද, ඒ ඉල්ලීම ඉෂ්ට කිරීම මහජන යහපත පිණිස වන හෙයින් ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

**1.** මේ පනත 2009 අංක 59 දරන ශ්‍රී ලංකා ජමාඅත් අන්සාරිස් සුන්නතිල් මොහමදියා සංගමය (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

ශ්‍රී ලංකා ජමාඅත් අන්සාරිස් සුන්නතිල් මොහමදියා සංගමය සංස්ථාගත කිරීම.

**2.** මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භවන දින සිට සහ ඉන් පසු (මෙහි මින් මතු " සංගමය" යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකා ජමාඅත් අන්සාරිස් සුන්නතිල් මොහමදියා සංගමයේ දැනට සාමාජිකයන්ව සිටින තාක් තැනැත්තන් හෝ මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවට මින්මතු ඇතුළත් කරනු ලබන සාමාජිකයන් "ශ්‍රී ලංකා ජමාඅත් අන්සාරිස් සුන්නතිල් මොහමදියා" යන නාමය සහ අභිධානය යටතේ අඛණ්ඩව පැවැත්මක් ඇති (මෙහි මින්මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) සංස්ථාවක් විය යුතු අතර, පොදු මුද්‍රාවක් තබාගැනීමේ ද එය පාවිච්චි කිරීමේ සහ ස්වකීය

2-PL 004198—2,650 (2009/07)

අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද සම්පූර්ණ බලය හා අධිකාරය ඒ සංස්ථාවට ඇත්තේ ය. තව ද එකී සංස්ථාපිත නාමයෙන් ඒ සංස්ථාව විසින් ද එයට විරුද්ධව ද නඩු පවරනු ලැබිය හැකි ය.

සංස්ථාවේ පොදු පරමාර්ථ.

3. සංස්ථාව සංස්ථාපනය කිරීමට අරමුණු කොටගත් පොදු පරමාර්ථ පහත දැක්වෙන පරිදි විය යුතු යයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ:—

(අ) ශුද්ධ කුර්ආනයේ සහ මුහම්මද් නබි (සල්) තුමාගේ සුන්නා පදනම් කරගෙන ඉස්ලාම් ධර්මය පිළිබඳ ප්‍රගුණ කිරීම හා පැතිරීම ;

(ආ) මුස්ලිම්වරු ඉස්ලාම් ධර්මයට අනුව තමන්ගේ ක්‍රියාකාරකම් මෙහෙයවීම සඳහා සූදානම් කිරීම සහ මග පෙන්වීම;

(ඇ) ඉස්ලාම් භක්තියේ පණිවුඩය පතුරුවාලීම පිණිස සහ එම ධර්මයේ ක්‍රියාකාරකම් කෙරෙහි යෙදීම පිණිස දැනුමෙන් සහ නිපුනත්වයෙන් මුස්ලිම්වරු අංග සම්පූර්ණ කිරීම ;

(ඈ) ආරාබි භාෂාව ඉගෙනීමට දිරිගැන්වීම සඳහා ශිෂ්‍යයන්හට සම්පූර්ණ පහසුකම් සැපයීම සහ පාඨමාලා හැදෑරීම පිණිස සෑම දිස්ත්‍රික්කයක් පාසාම ආරාබි පාසල් සහ මද්රසාවන් බිහි කිරීම හා ඒවා පවත්වාගෙන යාම;

(ඉ) සෑම දිස්ත්‍රික්කයක් පාසාම ශාඛා බිහි කිරීම, ඒවා පවත්වාගෙන යාම කළමනාකරණය කිරීම හා සංවර්ධනය කිරීම ;

(ඊ) ඉස්ලාම් ආගම ප්‍රගුණ කරවීම සඳහා ඉංග්‍රීසි, සිංහල, දෙමළ හා අරාබි භාෂාවලින් පොත්, සඟරා, වාර සඟරා, පත්‍රිකා, පුවත් පත් මුද්‍රණය කිරීම සහ ශ්‍රව්‍ය - දෘෂ්‍ය සහ සංයුක්ත තැටි, බහු මාධ්‍ය උපකරණ නිෂ්පාදනය කිරීම, මුද්‍රණය කිරීම හා විකිණීම;

(උ) මුස්ලිම්වරුන්ගේ ප්‍රයෝජනය සඳහා ඉස්ලාම් පුස්තකාලයන් ආගමික ස්ථානයන්, මුස්ලිම් පල්ලි ආදිය තැනීම, අළුත්වැඩියා කිරීම, පුනරුත්ථාපනය ප්‍රතිසංස්කරණය සහ එම ස්ථාන අංගසම්පූර්ණ කිරීම පිණිස සහාය වීම ;

(ඌ) මුස්ලිම්වරුන් අතර ඉස්ලාම් ආගම පිළිබඳ දැනුම ප්‍රගුණ කිරීම පිණිස සහ ඉස්ලාම් ආගමේ මූලධර්ම ප්‍රායෝගිකව අනුගමනය කිරීම, උනන්දු කිරීම පිණිස පන්ති, රැස්වීම්, සම්මන්ත්‍රණ, සාකච්ඡා, සහ වැඩමුළු සංවිධානය කිරීම සහ පැවැත්වීම ;

(එ) ශ්‍රී ලංකාවේ මුස්ලිම් ජනතාවගේ අධ්‍යාපනික, සමාජීය සහ ආර්ථික අභිවෘද්ධිය සඳහා අවශ්‍ය ආධාර සහ පහසුකම් සැළැස්වීම ;

(ඒ) ශ්‍රී ලංකාවේ විවිධ ආගමික කොටස් සහ ප්‍රජාවන් අතර ආගමික සහ ජාතික සහයෝගීතාවය සඳහා අවශ්‍ය ආධාර සහ පහසුකම් සැළැස්වීම ; සහ

(ඔ) ශ්‍රී ලංකාව තුළ සහ ඉන් පිටත සමාන අරමුණුවල යෙදී සිටින වෙනත් ඉස්ලාමීය අයතන සමග මිත්‍ර සම්බන්ධතා ඇතිකර ගැනීම සහ පවත්වාගෙන යාම.

4. පනතේ විධිවිධානවලට සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව සංස්ථාවට පහත දැක්වෙන බලතල තිබිය යුතු ය. සංස්ථාවේ බලතල.

(අ) සංස්ථාවේ පරමාර්ථ ප්‍රවර්ධනය කිරීමේ අදහසින් සංස්ථාවට නීත්‍යානුකූලව අවශ්‍ය විය හැකි ඉඩම් හෝ ගොඩනැගිලි මිලට ගැනීම, අත්කර ගැනීම, කුළියට ගැනීම, ඉදිකිරීම හෝ අන්‍යාකාරයෙන් ලබා ගැනීම සහ උචිත යයි හැඟී යන පරිදි ඒවා සම්බන්ධයෙන් අවශ්‍ය පරිදි කටයුතු කිරීම සහ බැහැර කිරීම;

(ආ) සංස්ථාවේ කාර්යය සඳහා යම් තැනැත්තකු හෝ සංස්ථාගත හෝ අන්‍යාකාර පුද්ගල මණ්ඩලයෙන් දේශීය වශයෙන් හෝ විදේශීය වශයෙන් දායක මුදල්, ආධාර, මුදල් පරිත්‍යාග සහ සියලු ආකාරයෙන් තැගි ආයාචනය කර සිටීම, එක්රැස් කිරීම සහ ලබා ගැනීම ;

(ඇ) සංස්ථාවේ කාර්ය සඳහා අවශ්‍ය වන නිළධාරීන් සහ සේවකයන් පත් කිරීම, පාරිශ්‍රමික ගෙවීම සහ ඔවුන් සම්බන්ධයෙන් විනය පාලනය ;

(ඈ) සංස්ථාවේ කිසියම් කාර්යයක් සඳහා මුදල් ලබා ගැනීම හෝ ණයට ගැනීම සහ සංස්ථාව විසින් සුදුසු යයි කල්පනා කරන ආකාරයකින් යම් ණයක් හෝ බැඳීමකින් නිදහස් කිරීම සුරක්ෂිත කිරීම;

(ඉ) සංස්ථාවේ කාර්යය සඳහා වහාම අවශ්‍ය නොකරන අරමුදල් කළමනාකරණ මණ්ඩලය සුදුසු යයි කල්පනා කරන ආකාරයට ආයෝජනය කිරීම සහ කලින් කල ඒ ආයෝජන වෙනස් කිරීම සහ මාරු කිරීම;

(ඊ) සංස්ථාවේ පරමාර්ථ ශ්‍රී ලංකාවේ සහ විදේශයන් හි ප්‍රවර්ධනය කිරීම පිණිස, සංස්ථාව විසින් අනුග්‍රහය දක්වන හා පවත්වනු ලබන වෙනස් කටයුතු, වැඩසටහන් හා ව්‍යාපෘති සඳහා වෙනම වූ ශාඛා සහ ආයතන පිහිටුවීම, සංවිධානය කිරීම හා නඩත්තු කිරීම ;

(උ) සංස්ථාවේ කාර්ය සඳහා අවශ්‍ය කිසියම් ගොඩනැගිලි සෑදීම, වෙනස් කිරීම හෝ නඩත්තු කිරීම ;

(ඌ) යම් ඉඩමක් හෝ පුද්ගලික දේපළවලට බලපවත්නා කිසියම් නීත්‍යානුකූළ භාර සහ කොන්දේසි භාර ගැනීම, පිළිගැනීම, ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම සහ පවත්වාගෙන යාම;

(එ) කිසියම් පුන්‍ය කටයුත්තක් සඳහා දායක වීම හෝ මුදල් ප්‍රදානය කිරීම ; සහ

(ඒ) සංස්ථාවේ බලතල ක්‍රියාත්මක කිරීම සහ කර්තව්‍ය හා කාර්යය ඉටු කිරීම පිණිස හෝ සංස්ථාවේ කටයුතු පවත්වාගෙන යාම පිණිස හෝ පරමාර්ථ ශක්තිමත් කිරීම පිණිස අවශ්‍ය වන්නා වූ සියලු කොන්ත්‍රාත්වලට හා ගිවිසුම්වලට සංස්ථාව විසින් කෙලින්ම හෝ තත්කාර්ය සඳහා සංස්ථාව විසින් බලය දෙන ලද එහි නිලධාරීන්ගේ හෝ සේවකයන්ගේ හෝ නියෝජිතයන්ගේ මාර්ගයෙන් ඇතුළුවීම හෝ ඉටු කිරීම.

5. (1) සංස්ථාවට එහි ම අරමුදලක් තිබිය යුතු අතර, මේ දක්වා හෝ මින්මතු තෑගි, ඉල්ලීම්, පරිත්‍යාග, දායක මුදල් ආධාර, ගාස්තු හෝ ප්‍රදාන වශයෙන් ලැබෙන සියලු මුදල් කළමනාකරණ මණ්ඩලය විසින් තීරණය කරනු ලබන එක් බැංකුවක හෝ ඊට වැඩි ගණනක සංස්ථාවේ බැරට තැන්පත් කරනු ලැබිය යුතු ය. සංස්ථාවේ අරමුදල.

(2) සංස්ථාවේ සියලු පරමාර්ථ හෝ ඉන් යම් පරමාර්ථයක් සාක්ෂාත් කරගැනීමේ කාර්යය සඳහා ගොඩනැගිලි අරමුදල, පර්යේෂණ අරමුදල සංවර්ධන අරමුදල, ශිෂ්‍යත්ව අරමුදල, සකාත් අරමුදල, හජ් අරමුදල, වැන්දඹු සහ අනත්දරු අරමුදල, සහ ස්වාභාවික විපත් අරමුදල, වැනි වෙනස් වර්ගවල අරමුදල් සංස්ථාව විසින් පිහිටුවනු ලැබිය හැකි ය.

(3) මේ පනත යටතේ වූ ස්වකීය බලතල ක්‍රියාත්මක කිරීමේ දී සහ කාර්යය හා කර්තව්‍ය ඉටු කිරීමේ දී සංස්ථාව විසින් දරනු ලබන යම් වියදමක් පියවීම පිණිස අවශ්‍ය සියලු මුදල් සංස්ථාවේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

6. යම් මිලට ගැනීමක්, ප්‍රදානයක්, තෙස්තමේන්තු නීයාදනයක් ප්‍රකාර හෝ වෙනත් යම් ආකාරයකින් සංස්ථාව වෙත සතු වූ චංචල හෝ නිශ්චල යම් දේපළක් අත්කර ගැනීමට සහ දැරීමට නීතියෙන් සංස්ථාවට බලය හා හැකියාව ඇති අතර, ඒ දේපළ විකිණීමේ, බදු දීමේ, කුළියට දීමේ, හුවමාරු කිරීමේ හෝ වෙනත් ආකාරයකින් බැහැර කිරීමේ පූර්ණ බලය ඇතිව සංස්ථාවේ රීති වලට යටත් ව සංස්ථාව විසින් දැරිය යුතු ය. සංස්ථාව විසින් චංචල හෝ නිශ්චල දේපළ දැරීම.

7. සංස්ථාවේ කටයුතු තත්කාර්ය සඳහා වූ 11 වන වගන්තිය යටතේ වූ සංස්ථාවේ රීතිවලට යටත් ව කළමනාකරණ මණ්ඩලය මගින් කළමනාකරණය කරනු ලැබිය යුතු ය. කළමනාකරණ මණ්ඩලය සංස්ථාවේ රීති අනුව තෝරාපත් කරනු ලැබිය යුතු ය. සංස්ථාවේ පළමුවන කළමනාකරණ මණ්ඩලය මේ පනත ක්‍රියාත්මක වීමේ දිනයට පෙරාතුව ම වූ දිනයේ ධුර දරන ශ්‍රී ලංකා ජමාඅත් අන්සාරිස් සුන්නතිල් මොහමදියා සංගමයේ කළමනාකරණ මණ්ඩලය විය යුතු ය. සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

8. කවර ආකාරයකින් වුව ද ලැබී ඇති සංස්ථාවේ මුදල් සහ දේපළ මෙහි දක්වා ඇති පරිදි වූ එහි පරමාර්ථ ප්‍රවර්ධනය කිරීම උදෙසා පමණක් යොදාගත යුතු අතර, එහි කිසියම් කොටසක් සංස්ථාව ලාභ උපදවන සංවිධානයක් නොවිය යුතු බව.

ලාභාංශ, ණය, ප්‍රසාද මුදල් හෝ කවරාකාර වූ හෝ ලාභ වශයෙන් කෙළින්ම හෝ අන් ආකාරයකින් සංස්ථාවේ සාමාජිකයන්ට ගෙවනු නොලැබිය යුතු ය.

එසේ වුව ද පහත දැක්වෙන ගෙවීම් කරනු ලැබිය හැකිය :—

(අ) සංස්ථාවේ යම් නිලධරයකුට හෝ සේවකයකුට නැතහොත් සංස්ථාවේ යම් සාමාජිකයකුට ඔහු විසින් සංස්ථාවට කරන ලද සේවය සඳහා සාධාරණ සහ නිසි පරිශ්‍රමිකයක් ගෙවීම ;

(ආ) සංස්ථාවේ යම් සාමාජිකයකු විසින් හෝ සංස්ථාවේ සාමාජිකයකු කොටස් හිමියකු වන යම් සමාගමක් විසින් සංස්ථාවට කුළියට දී ඇති පරිශ්‍රයක් සඳහා සාධාරණ සහ නිසි ගෙවල් කුළියක් ගෙවීම ;

(ඇ) ස්වකීය කර්තව්‍ය හෝ කාර්යයන් කිරීමේ දී හෝ ඉටු කිරීමේ දී නැතහොත් සංස්ථාවේ පරමාර්ථ ප්‍රවර්ධනය කිරීමේ දී සංස්ථාවේ යම් සාමාජිකයකු, නිලධරයකු හෝ සේවකයකු විසින් කළමනාකරණ මණ්ඩලයේ පූර්ව අනුමැතිය ඇතිව දරන ලද සාධාරණ සහ නිසි වියදම් ප්‍රතිපූරණය කිරීම හෝ ආපසු ගෙවීම.

සංස්ථාවට අයවිය යුතු සහ සංස්ථාවට ගෙවිය යුතු ණය.

**9.** මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භවන දිනයට පෙරාතුවම වූ දිනයේ දී සංගමයේ සියලු ණය සහ වගකීම් මෙයින් ඇති කරනු ලබන සංස්ථාව විසින් ගෙවනු ලැබිය යුතු අතර, එදිනට සංගමයට අයවීමට ඇති සියලු ණය ගෙවිය යුතුව ඇති දායක මුදල් සහ සාමාජික මුදල් මේ පනතේ කාර්යය සඳහා සංස්ථාවට ගෙවිය යුතු ය.

සංස්ථාවේ ගිණුම් සහ විගණනය.

**10.** (1) සංස්ථාවේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය ;

(2) (i) සංස්ථාව වෙත ලැබෙන හෝ සංස්ථාව විසින් කරනු ලබන සියලු මුදල් ;

(ii) සංස්ථාවේ වත්කම් සහ බැරකම් ; සහ

(iii) සංස්ථාවේ වෙනත් සියලු ගනුදෙනු සම්බන්ධයෙන් නිසි ගිණුම් පොත් තබා ගැනීමට සංස්ථාව විසින් කටයුතු සැලැස්විය යුතු ය.

(3) සංස්ථාවේ ගිණුම් සහ ශේෂ පත්‍රය යටත් පිරිසෙයින් වර්ෂයකට වරක්වත් යම් තත්කාර්ය සඳහා සංස්ථාව විසින් පත් කරන ලද සුදුසුකම් ලත් විගණකවරයකු හෝ විගණකවරයන් ලවා විගණනය කරවනු ලැබිය යුතු ය. ;

(4) මේ වගන්තියේ "සුදුසුකම් ලත් විගණකවරයා" යන්නෙන්—

(i) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතිය මගින් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක සාමාජිකයකු වන සහ එකී ආයතනයේ සභාව විසින් ගණකාධිකාරීවරයකු ලෙස සේවයේ යෙදීමට නිකුත් කරන ලද සහතිකයක් සන්තකයේ ඇති තැනැත්තකු ; හෝ

(ii) එක් එක් නේවාසික කොටස්කරු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතිය මගින් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක සාමාජිකයකු වන්නා වූ ද ගණකාධිකාරීවරයකු ලෙස වෘත්තියෙහි යෙදීම සඳහා එම ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් සන්තකයේ දරන්නා වූ ද, ගණකාධිකාරීවරුන්ගේ ආයතනයක්,

අදහස් වේ.

(5) සංස්ථාවේ ගිණුම් සහ ශේෂ පත්‍රය සංස්ථාවේ සාමාජිකයන්ට සියලු සාධාරණ වේලාවන්හි දී පරීක්ෂාකර බැලීම පිණිස විවෘතව තැබිය යුතු ය.

සංස්ථාවේ රීති.

11. සංස්ථාවට සාමාජිකයන් ඇතුළත් කර ගැනීම, ඔවුන්ගේ අස්වීම හෝ ඔවුන් අස් කිරීම සම්බන්ධයෙන් ද නිලධරයන්ගේ හා කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකයන් තෝරා පත් කර ගැනීම සම්බන්ධයෙන් ද නිලදරන්නන්ගේ හෝ සංස්ථාවේ කළමනාකරණ මණ්ඩලයේ යම් පුරප්පාඩුවක් පිරවීම ඇතුළුව සාමාන්‍යයෙන් සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම සම්බන්ධයෙන් සහ එහි

පරමාර්ථ මුදුන්පත් කරගැනීම සම්බන්ධයෙන් ද කලින් කල කළමනාකරණ මණ්ඩලයේ කිසියම් රැස්වීමක දී සංස්ථාව විසින් මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන රීති සෑදීම නීත්‍යනුකූල වන්නේ ය. ඒ රීති සෑදීමෙන් පසුව එවැනිම රැස්වීමක දී එවැනිම ආකාරයෙන් ඒවා වෙනස් කිරීම, ඒවාට යමක් එකතු කිරීම හෝ පරිච්ඡින්න කිරීම කළ හැකි ය.

සංස්ථාවේ මුද්‍රාව.

12. සංස්ථාවේ කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකයන් දෙදෙනකු ඉදිරිපිට දී මිස සංස්ථාවේ මුද්‍රාව කිසිදු සාධන පත්‍රයකට නොතැබිය යුතු අතර, එකී තැනැත්තන් තමා පැමිණ සිටින බවට සළකුණක් වශයෙන් එකී සාධන පත්‍රයෙහි තම නම අත්සන් කළ යුතු ය. එම අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකුගේ අත්සන් කිරීමකට පරිබාහිරව විය යුතු ය

විසුරුවා හැරීමෙන් පසු ඉතිරිවන දේපළ.

13. සංස්ථාව විසුරුවා හැරීමෙන් පසුව එහි සියලු ණය සහ බැරකම් ගෙවා බේරුම් කිරීමෙන් පසු කවර වූ හෝ දේපළක් ඉතිරි වේ නම් ඒ දේපළ සංස්ථාවේ සාමාජිකයන් අතර බෙදා දෙනු නොලැබිය යුතු අතර, සංස්ථාවේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇත්තා වූ ද යම් ආදායමක් හෝ දේපළක් තම සාමාජිකයන් අතර බෙදා දීම ස්වකීය රීති මගින් තහනම් කරනු ලැබ ඇත්තා වූ ද, වෙනත් යම් ආයතනයකට හෝ ආයතනවලට එම දේපළ දීම හෝ පැවරීම කරනු ලැබිය යුතු ය. එකී ආයතනය හෝ ආයතන සංස්ථාව විසුරුවා හැරීමේ දී හෝ ඊට පෙරාතුව ම සංස්ථාවේ සාමාජිකයන් විසින් නිශ්චය කරනු ලැබිය යුතු ය.

ජනරජයේ සහ අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

14. ශ්‍රී ලංකා ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙනත් යම් තැනැත්තකුගේ අයිතිවාසිකම්වලට මේ පනතෙහි ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවන්නේ ය.

අනනුකූලතාවයක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

15. මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.